(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 95.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 අගෝස්තු මස 26 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

158/'15

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර තුළ පයිනස් හා ඉයුකැලිප්ටස් වගා කර ඇති අක්කර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වගාව නිසා පරිසරයට ඇති වාසි හා අවාසි කවරේද;

(iii) පයිනස් හා ඉයුකැලිප්ටස් වගාව නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පයිනස් හා ඉයුකැලිප්ටස් වෙනුවට දේශීය ශාක වගා කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ශාක වර්ග මොනවාද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී දේශීය ශාක වගා කිරීමට පියවර ගන්නේද;

(iv) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

459/'16

2\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2014 දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් ආරම්භ කරන ලද කොළඹ 06, කිරුළපන, මිහිඳුපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම නිවාස ව්‍යාපෘතිය අවසන් කරන ලද දිනය කවරේද;

(iii) ඉදිකිරීම් නිම කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් භාරව කටයුතු කළ දේශීය සමාගම, අක්කර 2ක් පමණ වූ එම රජයේ භූමි භාගය තම පෞද්ගලික බර වාහන ගාල්කිරීමට භාවිතා කරන බව දන්නේද;

(ii) මෙම ඉඩම පාවිච්චි කිරීම වෙනුවෙන් එම සමාගම රජයට ගෙවනු ලබන මාසික බදු කුලිය කොපමණද;

(iii) බදු කුලී නොගෙවා ඉඩම පරිහරණය කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

660/'16

3.

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන පාසල්වල ඇතැම් විදුහල්පතිවරු හා ගුරුවරු විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නොයෙකුත් අසාධාරණකම්වලට හා ශාරීරික සහ මානසික වධ හිංසනවලට ලක් කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එසේ මානසික හා ශාරීරික පීඩාවන්ට ලක් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මානසික හා ශාරීරික පීඩාවන් වැළැක්වීමට සහ ඔවුන්ගේ විනයානුකූල හැසිරීම පිළිබඳව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා දැනුවත් කර ඔහු සමඟ සාකච්ඡා කර කිසියම් පියවරක් ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

673/'16

4.

ගරු බිමල් රත්නායක මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල රජය මඟින් සරණාගත කඳවුරු පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම කඳවුරු පිහිටි ස්ථාන, ඒවායේ සිටින පුද්ගලයන් හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කඳවුරුවල සිටින ජනතාව සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය එක් එක් කඳවුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් පුද්ගලයකුට හා එක් පවුලකට මසකට ලබාදෙන ආධාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සරණාගත පුද්ගලයන් සතු ඉඩම් හෝ නිවාස, රජය හෝ පෞද්ගලික ආයතන හෝ වෙනත් පුද්ගලයන් විසින් භුක්ති විඳින්නේ නම්, එම තොරතුරු සහ එම ඉඩම්/නිවාස සතු සරණාගත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම සරණාගතයන් අතරින් පදිංචිය සඳහා ඉඩමක් හෝ නිවසක් නොමැති පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් කඳවුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

703/’16

5\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවකයන් විශ්‍රාම ගන්නා වයස අවුරුදු 55ක්ව තිබියදී ක්‍රියාත්මිතයේදී මියගිය රණවිරුවන්ගේ පවුල් සඳහා ලබාදෙන මාසික වැටුප මියගිය රණවිරුවාට වයස අවුරුදු 55 සම්පූර්ණ වනතෙක් ලබා දීමට රජය විසින් තීරණය කර තිබූ බවත්;

(ii) රාජ්‍ය සේවකයන්ට වයස අවුරුදු 58 දක්වා ස්වයංක්‍රීයව ද, අවුරුදු 58 සිට 60 දක්වා පූර්ව අනුමතිය ලබා ගැනීමෙන්ද, විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60 දක්වා ඉහළ නංවා ඇති බවත්;

(iii) දිවි පිදූ රණවිරුවන්ගේ පවුල්වලට තවමත් මාසික වැටුප ලබා දෙන්නේ රණවිරුවාට වයස අවුරුදු 55 පිරෙන තෙක් පමණක් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දිවි පිදූ රණවිරුවන්ගේ පවුල්වලට රණවිරුවාගේ මාසික වැටුප ඔහුට වයස අවුරුදු 60 සම්පූර්ණ වනතෙක් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එකී සංශෝධනය සිදු කිරීමට අපේක්ෂා කරන්නේ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

718/’16

6\.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි,

(i) පිහිටි එකම දෙමළ මාධ්‍ය ජාතික පාසල වන අ / සහිරා විද්‍යාලය නොසලකා හැරීම හේතුවෙන් විවිධ අඩුපාඩු සහිත වන බවත්;

(ii) “පාසල් 1000” වැඩසටහනට කාඩාණ්ඩුගම, ජායා මුස්ලිම් මහා විද්‍යාලය හා කහටගස්දිගිලිය මුස්ලිම් මහා විද්‍යාලය ඇතුළත් කර ඇති නමුත් තාක්ෂණ විද්‍යාගාර හැර වෙනත් කිසිදු පහසුකමක් මේ වනවිට ලබා දී නොමැති බවත්;

(iii) සිංහල සහ දෙමළ මාධ්‍ය පාසල්වල ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි සහ තාක්ෂණවේදය වැනි විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ (i) හි සඳහන් පාසලෙහි,

(i) උසස් පෙළ විද්‍යා අංශයේ පවතින ගුරු හිඟය සපුරනු ලබන;

(ii) නව ගොඩනැගිල්ලක් ලබා දෙනු ලබන;

(iii) විදුහල්පතිවරයා සඳහා කාර්යාලයක් සහ ශ්‍රවණාගාරයක් ලබා දෙනු ලබන;

(iv) පානීය ජල පිරිපහදු යන්ත්‍රයක් ලබා දෙනු ලබන;

දිනය කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (ii) සඳහන් පාසල් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබාදෙනු ලබන;

(ii) ඉහත අ (iii) හි සඳහන් පුරප්පාඩු පුරවනු ලබන;

දිනය කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

722/'16

7.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මැයි මාසයේ ඇති වූ හදිසි ගංවතුර හේතුවෙන් හානියට පත්වූ වගාව සහිත කුඹුරු හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම හානියෙන් දළ වශයෙන් සිදුවී ඇති පාඩුව කොපමණද;

(iii) හානියට පත් කුඩා වැව් ඇතුළු වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(iv) අලාභ හානි සිදුවූ වාරි ව්‍යාපෘති පිහිටි දිස්ත්‍රික්ක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරි කාලයේදී රටේ ආහාර සුරක්ෂිතතාවය සඳහා මෙම ගංවතුර හානිය බලපාන්නේද;

(ii) විපතට පත් ගොවි ජනතාව වෙනුවෙන් රජය සහන ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

727/'16

8.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට තුළදී එකලස් කරන ලද, එහෙත් ලියාපදිංචි කර නොමැති වාහන ලියාපදිංචි කිරීමට විශේෂ අවසරයක් 2016 අයවැය යෝජනා මඟින් ලබා දුන් බව පිළිගන්නේද;

(ii) 2016 මාර්තු 31ට පෙර ලියාපදිංචි කරන ලද වෙළඳ වාහන සංඛ්‍යාව සහ එම වාහන ලියාපදිංචි කර ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) රුපියල් මිලියනයක් ගෙවීමෙන් ලියාපදිංචි කරන ලද මෝටර් රථ සංඛ්‍යාව සහ එම මෝටර් රථ ලියාපදිංචි කර ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

383/'15

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දකුණු පළාත සඳහා අනුයුක්ත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවය කරන නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) අවසාන වරට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් බඳවා ගත් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පුහුණුව අවසන් කර මේ වනතෙක් බඳවා නොගත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සිටීද;

(ii) එසේ නම්, එම නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් බඳවා ගැනීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දකුණු පළාතේ, රජයට හා පළාත් සභාවට අයත් මහ රෝහල් තුළ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

674/'16

10.

ගරු බිමල් රත්නායක මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශ ලේකම්වරයන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා සහ සමාගම්වල සභාපතිවරයන් සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ආයතනයට අයත් නිල නිවාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම නිල නිවාස දැනට භාවිතා කරන පුද්ගලයින්ගේ නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම නිල නිවාස වෙන් කිරීම සඳහා අනුගමනය කරන රෙගුලාසි සඳහන් චක්‍රලේඛයක් හෝ ලේඛනයක් තිබේද;

(v) එසේ නම්, එය සභාගත කරන්නේද;

(vi) රෙගුලාසි ලේඛනයක් නොමැති නම්, නිවාස වෙන් කරනු ලබන පටිපාටිය කවරේද;

(vii) නිවාස වෙන් කරනු ලබන රෙගුලාසි හෝ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැතිව නිවාසවල රැඳී සිටින්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

704/'16

11.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අප්‍රේල් මස සිට ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි පළකරන, ණය අර්බුදය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එකී ප්‍රචාරක දැන්වීම් පළ කරන ලද පුවත්පත්වල නම් සහ එක් එක් පුවත්පතේ දැන්වීම් පළ කිරීමට වැය වූ මුදල, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී දැන්වීම් විකාශනය කිරීම සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකාවන්ට ගෙවූ මුදල්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත් ආකාරය කවරේද;

(v) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ රජයේ මුදල් භාවිතයෙන් නම්, ඒ සඳහා අරමුදල් සපයා ගත් වැය ශීර්ෂය කවරේද;

(vi) එකී දැන්වීම් සඳහා අරමුදල් සපයා ගත්තේ අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල අනුග්‍රහයෙන් නම්, එම ආයතනවල නම් සහ එක් එක් ආයතනයෙන් ලබා දුන් මුදල්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

719/'16

12.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශාල ගැටලුවක්ව පවතින පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා රජය මහා පරිමාණ පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කළද ඒවායින් ප්‍රමාණවත් ප්‍රයෝජනයක් නොලැබුනු බවත්;

(ii) මෙම දිස්ත්‍රික්කයේ 25,000කට අධික පිරිසක් වකුගඩු රෝගයෙන් පෙලෙන අතර ඒ අතරින් 11,000ක පිරිසක් මාරාන්තික තත්ත්වයෙන් තමන්ගේ ජීවිතය ගෙවන බවත්;

(iii) පානීය ජලයට කැඩ්මියම් වැනි රසායනික ද්‍රව්‍ය මිශ්‍ර වීම හේතුවෙන් මෙවැනි රෝග තත්ත්වයන් ඇතිවන බවත්;

(iv) වකුගඩු රෝගය වැළැක්වීමේ අරමුණින් මේ වනවිට සවිකර ඇති ජලය පිරිසිදු කරන යන්ත්‍ර ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පානීය ජල ප්‍රශ්නය පවතින ප්‍රදේශවලට පානීය ජලය ලබාදීමට නව වැඩසටහන් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) රෝගීන් බහුල වශයෙන් ජීවත්වන ප්‍රදේශවලට ජලය පිරිසිදු කරන යන්ත්‍ර ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

723/'16

13.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ දේශීය හා විදේශීය ණයබරතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මුළු ණයබරතාවය ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම ප්‍රතිශතය 2004 වර්ෂය වනවිට තිබූ ණයබරතාවයේ ප්‍රතිශතයට වඩා අඩුද වැඩිද;

(iv) එම ණය ගෙවීමට රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මැතක සිට එම ණයබරතාවය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් මෙරට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම දැන්වීම ප්‍රචාරය කිරීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනී මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රාජ්‍ය හා පෞද්ගලික ගුවන් විදුලි මාධ්‍යයන්ට වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිනපතා හා සති අන්ත පුවත්පත් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

728/'16

14.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1995 සිට මේ දක්වා ශ්‍රී ලංකා රජය විසින් අය කරනු ලබන සෘජු බදු වර්ග කවරේද;

(ii) එකී එක් එක් බදු වර්ගය අය කිරීමේ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 1995 සිට 2015 දක්වා සෘජු බදු මඟින් රාජ්‍ය අයභාරයට දක්වන ලද දායකත්වය (රුපියල්), එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් දායකත්වය රජයේ මුළු ආදායමෙහි සහ දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සංවර්ධිත රටවල් සමඟ සැසඳීමේදී, ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායම පහළ මට්ටමක පැවැතීමට හේතු කවරේද;

(vi) 2015 වර්ෂයේදී සාක් කලාපයේ රටවල්වලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායමෙහි හැසිරීම කෙබඳුද;

(vii) ශ්‍රී ලංකාවේ සෘජු බදු ආදායම ඉහළ නැංවීම සඳහා හඳුන්වාදීමට අපේක්ෂිත විශේෂ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

775/'16

15.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාවට අයත් පවුල් 1235 ක් පමණ ස්ථිරව පදිංචිව සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම, රණජයපුර ගම්මානයේ, ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකයට රජයේ වෛද්‍ය නිලධාරියෙකු අනුයුක්ත කර නොමැති බවත්;

(ii) රජයේ වෛද්‍යවරයෙකු ස්ථිර ලෙස අනුයුක්ත කර නොමැතිවීම හේතුවෙන්, යුද හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාවට අයත් වෛද්‍ය නිලධාරින් වරින් වර මෙම ඒකකයේ සේවය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගම්මානයේ ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකයට ස්ථිර රජයේ වෛද්‍යවරයෙකු ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.

අභාවප්‍රාප්ත ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— 2016 ජුනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 147 — වැඩසටහන 1,— † 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට" මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු.592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 147 | - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 1 | - මෙහෙයුම් වැඩසටහන | |
| පුනරාවර්තන වියදම් | | - | රු. 469,425,000 |
| මූලධන වියදම් | | - | රු. 123,500,000 |
| | | මුළු වියදම = | **රු. 592,925,000** |

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම**

| | |
|---|---|
| උපරිම වියදම් සීමාව | - රු. 2,000,000 |
| අවම ලැබීම් සීමාව | - රු. 150,000 |
| උපරිම හර ශේෂ සීමාව | - රු. 3,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 55,000,000.

*9.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධුරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*12.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**